කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| 7 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව I , II | කාලය පැය 03 |
|---|---|---|

නම : .............................................................................................................

1 කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නාට්‍යයේ තේමාව යනුවෙන් අදහස් කරන්නේ,
1. කථා වස්තුවයි
2. ජවනිකා හෙවත් අංක වේ
3. ප්‍රධාන අදහසයි
4. නාට්‍යමය අවස්ථාවයි

02. ශ්‍රව්‍ය මාධ්‍යයකට උදාහරණයකි,
1. චිත්‍රපටය
2. ගුවන් විදුලිය
3. රූපවාහිනිය
4. වේදිකා නාට්‍ය

03. පෙළ රචනයේදී රචකයා විසින් අධ්‍යක්ෂවරයාට සහ නළු නිළියන්ට දෙන උපදෙස් හඳුන්වන්නේ,
1. රංග අභ්‍යාස යනුවෙනි
2. රංග සැලසුම් යනුවෙනි
3. රංග විධාන යනුවෙනි
4. රංගෝපකරණ යනුවෙනි

04. "නම් පොත" භාවිතයෙන් වර්ධනය කරගත හැකි රංග හැකියාව,
1. පෙළ රචනයයි
2. උච්චාරණ හැකියාවයි
3. මානසික එකඟතාවයයි
4. කතන්දර ගෙතීමයි

05. යම් රංගනයකට පෙර කළ යුතු පළමු අභ්‍යාසය වන්නේ.
1. රිද්මයානුකූල අභ්‍යාසයකි
2. ශරීරය උණුසුම කිරීමේ අභ්‍යාසයකි
3. ස්වසන අභ්‍යාස
4. ශිථිලකරණ අභ්‍යාස

අංක 06 සිට 10 දක්වා හිස්තැනට සුදුසු පිළිතුර යොදන්න

06. පෙර සූදානමකින් තොරව චරිතයක් සිද්ධියක් හෝ අවස්ථාවක් රඟ දැක්වීම ................................................ වේ.

07. සිතින් යමක් සිතා අළුත් දෑ මැවීමට ඇති හැකියාව ................................................ වේ.

08. අද වෙස්සන්තර රාජ පුතා මන්ත්‍රී කුමාරි බඳී යන ගීතය................................................ තූර්තියේ එන්නකි

09. චලන ක්‍රියා පමණක් නොව නාද සහ හඬද ................................................ කළ හැකිය.

10. ශ්‍රී ලංකාව හා සම්බන්ධ ඓතිහාසික කථා ඇතුළත් ග්‍රන්ථයක් ලෙස ........................................ නම් කළ හැකිය.

**A** තීරුවේ පිළිතුරට ගැලපෙන පිළිතුර **B** තීරුවෙන් තෝරා ලියන්න.

| | | |
|---|---|---|
| 11. | වේෂ භූෂණ | ශරීරය සැහැල්ලු කිරීම |
| 12. | නාට්‍ය ගීත | සිරි පැරකුම් |
| 13. | ශිථිලකරණය | මහතලා හටන |
| 14. | චිත්‍රපට | දෝන කතිරිනා |
| 15. | ටෙලි නාට්‍යය | රංග වස්ත්‍ර රංගාභරණ |

16 සිට 20 දක්වා හරි වැරදි ලකුණු කරන්න.

16. රංගනයේදී අරමුණකින් තොරව කරනු ලබන ක්‍රියා රංග අභ්‍යාස වේ ( )
17. නාට්‍යෝචිත අවස්ථාවක කුතුහලයක් ඇත. ( )
18. සතුන්ගේ හඬ නළුවෙකුට අනුකරණය කිරීම අපහසුය ( )
19. රූපවාහිනියෙන් ප්‍රදර්ශනය වන වේදිකා නාට්‍යය මගින් උපරිම රස වින්දනයක් ලබා ගත හැක ( )
20. කාටූන් නිර්මාණයේදී සජීවී රූප කැමරාවක් මගින් රූගත කරයි ( )

## II කොටස

ප්‍රශ්න අංක 01 ඇතුළු තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

01.

පොර බදිමින් කෑමට නොසිටින්නේ
දුව හැපෙමින් වතුරට නොපනින්නේ
ගැඹුරු දියෙන් නෑමට නොවදින්නේ
තනිව ගොසින් නෑමට නොසිතන්නේ

1. ඉහත කවිය උපුටා ගන්නා ලද්දේ කුමන කෘතියකින්ද? (02)
2. කවියේ කියවෙන්නේ කුමන අවස්ථාවක් ද? (02)
3. එම අවස්ථාවේදි සිදුවිය හැකි නාට්‍යමය අවස්ථාවක් ලියා දක්වන්න. (06)

02.

1. ඔබ පාසලේදී ඉගෙන ගත් රංග අභ්‍යාස 02 ක් ලියන්න. (02)
2. ඉන් එකක් කරන ආකාරය විස්තර කරන්න (04)
3. එම අභ්‍යාසයේදී ඔබ ලබාගත් ප්‍රයෝජන දෙකක් ලියන්න (04)

03.

1. අනුෂාංගික ශිල්ප 4ක් නම් කරන්න (04)
2. ඉන් එකක් ගැන කෙටි විස්තරයක් කරන්න. (06)

04. ශිෂ්‍යයන් පිරිසක් අධ්‍යාපන චාරිකාවකට සහභාගී වී දිය ඇලි ආශ්‍රිත ප්‍රදේශයකට ඇතුළු වූ පසු ප්‍රථමයෙන්ම ගිය සිසුන් කිහිපදෙනෙක් දෙඹරයකට ගල් ගසයි. මෙම සිදුවීම ඇසුරෙන් කෙටි නාට්‍යයක් රචනා කරන්න.
(ලකුණු 10)